PLC

පීපල්ස් ලීසිං ඇන්ඩ්
ෆිනෑන්ස් පී.එල්.සී

2014/15

# 365 DAYS THAT WERE...

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී

2014/15

# 365 DAYS THAT WERE...

## පටුන


| | |
|---|---|
| සභාපතිතුමන්ගේ සමාලෝචනය | 5 |
| ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය | 9 |
| ස්වාධීන විගණක වරුන්ගේ වාර්තාවේ පරිවර්ථනය | 15 |
| ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය | 16 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 17 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 18 |



# සභාපතිතුමන්ගේ සමාලෝචනය



## 365 DAYS THAT WERE...

ඉතිහාසය තුල හොඳම කාර්යසාධන තත්ත්වයන් පෙන්වූ වසරක් නිර්මාණය සඳහා සමාගම එහි ව්‍යාපාර අකෘතිය හොඳින් කළමනාකරණය කිරීම, මඟ පෙන්වීම හා ප්‍රතිචාර දැක්වීම සිදුකරන ලදී.

"හුදෙක්ම වාණිජ ශක්‍යතාවන් මත පමණක් අවධානය කරන කෙටිකාලින මිනුම් වලින් ඈත් වී මෙහෙයුම් වල තිරසාර පියවරක් සදහා සැබවින්ම සමාජ හා පාරිසරික අංග වල දිගුකාලින ඒකාබද්ධ ප්‍රවේශය මහත් රුකුලකි"

"අපගේ ව්‍යාපාර උපායමාර්ග සමග ව්‍යපාර සංස්කෘතිය නිවැරදි ලෙස මිශ්‍ර වීම තුලින් පරිපාලනය, පාරිසරික හා සමාජ වගකීම නිසි ලෙස පෝෂණය කිරීමට හැකි විය. ඒ තුලින් ඉදිරි වර්ෂ තුල සමාගමට ඉහල ප්‍රතිඵල අත්කර දෙනු ඇතැයි නිසැකව සහතික කල හැකිය"

**හිතවත් සියළුම පාර්ශව කරුවනි,**

මා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී සමාගමේ පාලක මණ්ඩලයට සම්බන්ධ වීමේදී එම සමාගමේ තිරසාර ප්‍රගතිය උදෙසා මාර්ගෝපදේශකත්වය හා සහයෝගය ලබාදීම මාගේ රාජකාරිය බැව් හොදින් දැනුවත් විය. මා තනතුරට පත් වී මාසයක් පමණ වුවත් මීට අවුරුදු 18 කට පෙර ආරම්භ වූ මෙම සමාගමේ ප්‍රගතිය පිලිබඳ මා විශ්මයට පත්විය. අද වන විට ගුණාත්මක පාලනය හා ආචාරශීලී ව්‍යාපාර පරිචයන් සමග එහි මූඛ්‍ය පරමාර්ථ පෝෂණය කර ඒ තුලින් ඉහල ප්‍රතිඵල අත්කර ගෙන ඇති අතර ශ්‍රී ලංකාව තුල විශාලම බැංකු නොවන විශාලම මූල්‍ය ආයතනය බවට පත්වී ඇත.

" දින 365 ක් වු එය" යන තේමාව යටතේ මූල්‍ය ප්‍රකාශන ඇතුලත් 2014/15 වාර්ෂික වාර්තාව අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම ගෞරවයක් කොට සලකමි. ප්‍රධාන විධායක නිලධාරීතුමන්ට සමාගම අනුගමනය කල උපායමාර්ග, ක්‍රියාමාර්ග හා අත්පත් කරගත් සාර්ථකත්වයන් විග්‍රහ කිරීමට ඉඩ තබා මා විසින් සාර්ව ආර්ථික තත්ත්වයන් හා සමාගම වර්ෂය තුල සනිටුහන් කල කාර්යසාධනය සංසන්දනය කිරීම සහ තිරසාරභාවයක් ලබාගත හැකි අනාගත උපායමාර්ග පිලිබද විග්‍රහයක් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

### ගෝලීය ආර්ථිකය
දශකයකින් අධිකට වැඩි කාලයක් ලෝක ආර්ථිකය අවපාත තත්ත්වයක සිට යහපත් පසුබිමකට යොමු වෙමින් පැවතුනද තවමත් එය මධ්‍ය මට්ටමක පසුවේ. ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ සංවර්ධිත ජාතීන්ගේ හා ප්‍රධාන යුරෝපා ජාතීන්ගේ වර්ධනීය නැඹුරුව බලගන්වන පාරිභෝගික විශ්වාසයේ හා ආයෝජන අභිප්‍රායන්ගේ උද්යෝගය දැක ගත හැකි විය. ජපානයේ අය වැය හා මූල්‍ය උත්තේජක නොසලකා ශූන්‍ය වර්ධනයක් කරා ආර්ථිකය පසු බසින විට සමහරක් යුරෝපා රටවල් වල ආර්ථික තවමත් උදාසීන තත්ත්වයක පසුවේ. නැගීඑන සහ සංවර්ධනය වෙමින් පවතින ජාතීන් සමස්ථයක් ලෙස ශක්තිමත් වුවද ප්‍රතිපත්තිමය හා ව්‍යුහගත බාධක වල බලපෑමෙන් වර්ධනීය ප්‍රවනතාවය තරමක් අඩුකර ඇත. ගෝලීයව පැවැතුන බණිජ තෙල් මිලෙහි දැවැන්ත පහල යාම හා හුවමාරු අනුපාත වෙනස් වීම විවිධ මට්ටම් වල බලපෑම් හා ප්‍රතිවිපාක ගෙන දුනි. මැද පෙරදිග හා රුසියා- යුක්‍රේන ගැටලු තුලින් හු දේශපාලනික තත්ත්වයන් හා අවිනිශ්චිතතාවයන් තීව්‍ර වීමත් සමඟ කාළගුණික වෙනස් වීම ගෝලීය ශක්‍යතාවයන් හීන කර ඇත.

ඉහත සඳහන් තත්වයන් යටතේ 2014 වර්ෂය සඳහා ගෝලීය ආර්ථික වර්ධනය 3.4% ක් වුවත් 2015 වර්ෂය සඳහා තවමත් 3.5% ක සාමන්‍ය තත්ත්වයක් අපේක්ෂා කරයි. (වර්ලඩ් ඉකොනොමික් අවුට් ලුක් - 2015 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල)

### ශ්‍රී ලංකාවේ ආර්ථිකය - වර්ධනය හා ස්ථායීථාවය
අසම වූ ගෝලීය ආර්ථික නැඹුරුතාවයන් හා අභ්‍යන්තර අභියෝග හමුවේ ශ්‍රී ලංකාව සාපේක්ෂව සමබර සාර්ව ආර්ථික පරිසරයක් පවත්වා ගැනීමට සමත් වී ඇත. කලාපීය අනෙකුත් තරගකරී රටවල් හා දියුණු රටවල් වලට සාපේක්ෂව 7.4% ක පමණ ඉහල වර්ධන අනුපාතයක් පහසුවෙන් රඳවා ගැනීමට හැකිවී ඇත. කාලගුණ වෙනස් වීම කෘෂිකාර්මික අංශයේ අනාගත වර්ධනයට බලපෑමක් කලද කර්මාන්ත හා සේවා අංශ වර්ධනීය කාර්යසාධනයන් සටහන් කර ඇත. රටෙහි මූල්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව අඩු පොලී අනුපාත වෙළෙඳපොලට සපයා ඇතත් වර්ෂයේ අවසාන කාලය වන විටත් පෞද්ගලික අංශයේ ණය ඉල්ලුම ඉතා මන්දගාමී තත්ත්වයක පසු විය. හය වන වසරටත් ලෝක වෙළෙඳපොලෙහි වෙළෙඳ භාණ්ඩ වල මිල ගණන් පහල යාමේ නැඹුරුවක් සහිත මැදි තනි ඉලක්කමකට පවත්වා ගැනීම තුල උද්ධමනයද යම් සහන තත්වයක පසුවේ. ශක්තිමත් සංචිත තත්වයන් හා සාපේක්ෂව ස්ථායී හුවමාරු අනුපාත සමග ගෙවුම් ශේෂයේද යහපත් තත්වයන් දැකගත හැකිවිය. කෙසේ නමුත් මූල්‍ය ඒකාබද්ධකරණයට අපේක්ෂා කල ප්‍රතිඵල ලඟා කරගැනීමට නොහැකි විය. වර්ෂය තුළදී ඉහළ මැදි ආදායම් තත්ත්වයක් හා ස්ථාවර වර්ධන නම්‍යතාවයන් පවත්වා ගැනීමට බලාපොරොත්තු විය. (2014 වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව)

### බැංකු නොවන මූල්‍ය ආයතන - ප්‍රකෘති තත්වය නිරූපණය
ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති හා ණය සඳහා වූ හීන ඉල්ලුම තුල තවමත් මුදල් වෙළෙඳපොල තුල ඉහල ද්‍රවශීලතාවයක් ඇත. බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රය සාර්ව ආරක්ෂණ මූලධර්ම කෙරෙහි අවධානය යොමු කිරීම තුලින් ආර්ථිකය තුල එහි ස්ථානය පවත්වා ගෙන ඇත. ඒකාබද්ධකරණය තුලින් මෙම ක්ෂේත්‍රයේ ශක්තිමත්භාවය තවදුරටත් ඉහල නංවා ගැනීමට හැකිවිය. අක්‍රිය ණය කලඹවල් තරමක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර සහ ලාභ මට්ටම් හා ලාභ ආන්තිකයන් පුළුල් ලෙස තබා ගැනීමට අනුබල දී ඇත. පෞද්ගලික අංශයේ ණය පහල මට්ටමක පැවතීම තුළ වත්කම් පදනමෙහි වර්ධනය මධ්‍ය මට්ටමක පැවතුනි.

### ව්‍යාපාර ආකෘතිය - නිවැරදි සංකලනය
අපගේ සාර්ව පසුබිමෙහි සංකීර්ණතාවයන් තුල සමාගමේ ඉතිහාසය තුල හොඳම කාර්යසාධන තත්ත්වයන් පෙන්වූ වසරක් නිර්මාණය සඳහා කටයුතු කළමනාකරණය කිරීමට මඟ පෙන්වීමට හා ප්‍රතිචාර දැක්වීමට හැකිවන අයුරින් ව්‍යාපාර ආකෘතිය සමාගම සකස් කරන ලදී. සැබවින්ම වර්ෂය තුල පවත්වාගත් උපාය මාර්ගය ඉතා සමබර හා බුද්ධිමත් විය. වාණිජ ශක්‍යතාව මිණුම්කරණ කෙටි කාලීන මිනුම් දඬු වෙනුවට සමාජ හා පාරිසරික සාධක ද සංකලනය වූ දිගු කාලීන ප්‍රවේශයක් තුල මෙහෙයුම් කටයුතු වඩාත් තිරසාර විය. තීක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ අවශ්‍ය සුපරීක්ෂණය සමඟ නියාමන ආයතන නිකුත් කල සාංගමික යහපාලනයේ මනා පරිචයන් වලට අනුකූලව කටයුතු කිරීම තුල සමාගමට කර්මාන්තය තුල ඉහලම තැනක ස්ථාන ගත වීමට හැකියාව ලැබී ඇත.

එවැනි ව්‍යාපාර සැලැස්මක් තුල කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ උසස් කිරීමට හා ඉතා ඉහල මූල්‍ය කාර්යසාධනයක් ලඟාකර ගැනීමට සේවක කණ්ඩායම මෙහෙයවීමට අපට හැකි විය. පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 20.14% වර්ධනයකින් යුක්තව රු. බිලියන 3.75 ක ශුද්ධ ලාභයක් සමඟ ශක්තිමත් ශුද්ධ පොලී ඉපැයීමක් රඳවා ගැනීමට සමාගමට හැකිවිය. විනයානුකූල මෙහෙයුම්කරණ තුලින් අක්‍රිය ණය අනුපාතය ඉලක්ක ගත ලෙස හා බැංකු නොවන මූල්‍ය අංශයේ සාමාන්‍ය අගයට පහලින් පවත්වාගනිමින් ණය කලඹෙහි ගුණාත්මකභාවය පවත්වාගෙන යාමට හැකිවිය. කොටස් හිමියන්ගේ අරමුදල් සඳහා ප්‍රතිලාභය 18.61% ක් වැනි ශක්තිමත් අගයක පවතී.

මූල්‍ය ශක්තිය හා ක්ෂේත්‍රය තුල වූ පිලිගැනිම මත සමාගමේ වර්ෂය අවසාන දිනට මූල්‍ය තත්ත්වය ඉතා ශක්තිමත් එකක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව නියම කල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවයන් ඉක්මවා 20.22% ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් පවත්වා ගෙන ඇත.

සමාගම අත්පත් කරගත් මූල්‍ය කාර්යසාධනයන් පදනම් කරගනිමින් කොටස් හිමියන්ට රු. 0.50 ක අවසාන ලාභාංශයක් අප යෝජනා කරන ලදී.

### ඉදිරි දැක්ම
වර්ෂයක් තුල සලකුණු කල අනර්ඝ සාංග මික ගමන් මඟ හා යහපාලනය, පාරිසරික හා සමාජ වගකීම් පෝෂණය කරන සාංගමික සංස්කෘතියක් සමග මිශ්‍ර වූ

අපගේ ව්‍යාපාර උපායමාර්ග තුලින් වසර ගණනාවක් යන තෙක්ම අප සමාගමට විශිෂ්ඨ ප්‍රතිඵල අත්කර දීම පිළිබඳ කිසිදු සැකයක් නැත. ලෝක ආර්ථිකය තුළ පවතින වර්ධන ප්‍රවනතා සහ ශ්‍රී ලංකාව අත්පත් කරගැනීමට අපේක්ෂා කරන ඉහළ ආර්ථික මෙන්ම සාමාජ වර්ධනයන් තුළ අපගේ සමාගම තුළ පවතින ශක්තීන් හමුවේ අනාගතය තුළ දැවන්ත මෙහෙයුම් පදනමකට සමාගම රැගෙන යා හැකිය. ඒ අතර සමාගමේ කටයුතු දකුණු හා නැගෙනහිර ආසියාව දක්වා පුළුල් කිරීම ප්‍රධාන වේ.

අනාගත අපේක්ෂාවන් සඳහා අප සතුව මූල්‍ය හැකියාවක් පවතී. පීපල්ස් ලීසිං සන්නාමයේ ශක්තිමත් පසුබිමත් මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙක් වූ මව් සමාගමක් තිබීත්, ක්‍රමවත් හා ශක්තිමත් පරිපාලිත සමාගම් ජාලයක් පැවතිමත්, කාර්යඵල හබායන ක්‍රියාශීලි කණ්ඩායමක් සිටීමත්, නූතන ලෝකයට ගැලපෙන තාක්ෂණය සදහා ආයෝජන සිදුකිරීමත්, ඵලදයී අවදානම් කළමනාකරණ ක්‍රම හඳුන්වා දීමත් තුල සහ අපගේ සාංග මික සංස්කෘතියේ ලක්ෂණ තුල අප තව දුරටත් ප්‍රධාන පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් ඉහල වටිනාකමක් නිර්මාණය කිරීමට හැකිවන බව නියත වශයෙන් පැවසිය හැක. සමාජ වගකීම තවදුරටත් පවත්වා ගැනිම සඳහා ශුද්ධ ලාභයෙන් 2.5 % ක් සමාජ හා පාරිසරික ක්‍රියාමර්ග සදහා යෙදවීමට තීරණය කර ඇත. වගකීම, වගවීම හා වෘත්තීය දක්ෂතා මත වු අපගේ සාංගමික භාරකාරත්වය තුලින් එම අභිලාශයන් ඉෂ්ඨ කර ගැනීම සහතික කර ඇත. මේ සදහා අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ ඔහුගේ කළමණාකරන කණ්ඩායම සාර්ථකව බැදී සිටින බවට මා විශ්වාස කරන්නෙමි.

## ඇගයීම

මා සභාපති ධූරයේ වගකීම භාරගැනීමෙන් පසු මෙම සංවිධානය වඩාත් ක්‍රමවත්ව ඵලදායීව මෙහෙයවීමට මා හට සහයෝගය දුන් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී හා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුද කර සිටිමි. එසේම මෙම කාලය තුල මෙම සංවිධානයේ මෙහෙයුම් කටයුතු සඳහා උපායශීලී මඟපෙන්වීමක් ලබාදුන් ප්‍රධාන විධායක නිලධාරීතුමාට සහ ඔහුගේ කළමනාකරණ කණ්ඩායමට මාගේ ස්තුතිය පුද කරමි. ඔවුන්ගේ කළමනාකරණ හැකියාව අනාගත විශිෂ්ඨත්වයන් ලඟාකර දෙනු ඇතැයි මා තුල දැඩි විශ්වාසයක් පවතී. එසේම තම කාර්යයෙහි විශිෂ්ඨත්වය මැනවින් ඔප්පු කල සියළුම සේවකයින්ට මා හෘදයාංගමව ස්තුතිය පුද කර සිටිමි.

අපගේ සාංගමික මෙහෙයුම පිලිබද පැහැදීමකින් හා විශ්වාසයකින් කටයුතු කල සියළුම පාර්ශවකරුවන්ට මා ස්තුති කරන අතර සමෘද්ධිමත් හෙටක් හා විශිෂ්ඨ අරමුණු උදෙසා දැක්වූ සාමූහිකත්වය හා සහයෝගයට මා හෘදයාංගමව ස්තුතිවන්ත වෙමි.



**හේමසිරි ප්‍රනාන්දු**
*සභාපති*
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී

2015 අප්‍රේල් 29 දින
කොළඹදී.



# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය



## 365 DAYS THAT WERE...

"දින 365 ක් වු එය" නම් වු වාර්ෂික වාර්තාවේ තේමාවෙන් මැනවින් පිළිඹිබු වන, ව්‍යාපාර ආදර්ශ පාඨය තුළ හැසිරෙමින් ඉහළ හා නිම්නාදනීය මුල්‍ය ප්‍රතිඵල (කාර්යසාධනයක්) ලඟා කර ගැනීමටත් ඒ තුළින් මේ වසර ශක්තිමත් හා ඵලදායි වසරක් කිරීමට අපට හැකිවිය.

"හරිත පරිසරයක් නිර්මාණය කිරිමේ පරම අධිෂ්ඨානයෙන් යුතුව, අප ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයේ ප්‍රජාවත් සමග සම්බන්ධ විය යුතු හොඳම ක්‍රමය්, කාබනික පියවර සටහන් මැන බැලිමත්, හරිත පරිසරයක් සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයන් ද නිර්ණය කිරිමත් සිදු කරන ලදි"

"මේ වර්ෂය තුළ අපගේ ඒකාබද්ධ ප්‍රතිඵල මගින් පීපල්ස් ලීසිං සමූහයේ ශක්තිය මැනවින් පිළිඹිබු කරවයි."

සීග්‍රයෙන් වෙනස් වන ව්‍යාපාර පසුබිමක් මධ්‍යයෙහි පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී සමාගම 2014/15 මූල්‍ය වර්ෂය තුළ සමාගම ඉහළ තත්වයක රඳවා, වාර්තාගත කාර්යසාධනයක් සනිටුහන් කර ඇත. ස්ථාවර බැංකු නොවන මුල්‍ය ක්ෂේත්‍රයේ වරප්‍රසාදිත තත්වය පෝෂණය කරමින්, සංකලිත ව්‍යාපාර ප්‍රවේශය තුළ දැඩිව පිහිටවමින් සිදුකරන ලද ක්‍රියාමාර්ග සැලසුම් ක්‍රියාවෙහි යෙදවිම තුළ ව්‍යාපාරය අතිවිශේෂ ස්ථානයකට පත් කිරිමට හැකි විය. සාර්ථක ලෙස අප අවදානම මැඩපැවැත් වු අතර අප ක්‍රියාත්මක වන ව්‍යාපාර පරිසරය තුළ විසිරි පැතිරි ඇති අභියෝග ජය ගැනිමට දැඩි පරිශ්‍රමයක් දැරුවෙමු. ව්‍යාපාර ආදර්ශ පාඨය තුල සරමින්, උසස් උපායමාර්ගික සැලසුම්කරණය සහ තිරණාත්මක ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස ඉහළ හා නිම්නාදනීය කාර්යසාධනයක් ලඟා කර ගැනිම තුළින් මෙවසර ශක්තිමත් හා ඵලදායි වසරක් බවට පත් කිරිමට අපට හැකිවිය.  අපගේ දිගුකාලීන ශක්‍යතාවය ඉස්මතු කරවන ත්‍රිත්ව මට්ටම් වේදිකාවක් මත අපගේ අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහ කරන අතරතුර අප මේ වසරේ සාර්ථකත්වයට පත් වූ ආකාරය පිළිබඳ අතීතාවලෝකනයක් සිදුකිරිමට මෙම සාමාලෝචනය තුළින් බලාපොරොත්තු වේ.

### සංකලිත තත්වය දෙසට

සාකල්‍ය මට්ටමින් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමට අපගේ ව්‍යාපාර උපායමාර්ගය හොඳින් කේන්ද්‍රගත කරන ලදී. අපගේ ව්‍යාපාර ආචාරධර්ම හා අරමුණු තුළින් නිරූපණය වන පරිදි ආර්ථික, පාරිසරික හා සමාජීය යන තුන් වැදැරුම් ප්‍රවේශයන්, උපායමාර්ගික ප්‍රමුඛතාවයන් සමඟ සම්බන්ධ කරමින් අපගේ සියලු ම පාර්ශවකරුවන් සමඟ විශිෂ්ඨ සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට අප බලාපොරොත්තු වේ.

අප විනයගරුක බව ඉහළ නැංවීමට සහ දෛනික මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ඉහළ තත්ත්වයකට ගෙන ඒම සඳහා ලබා දෙන සේවා පුළුල් කිරීමට, ක්‍රියාවලි උසස් කිරීමට, අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට සහ යහපාලනය ඉහළ නැංවීමට හා සේවකයින්ගේ විශේෂඥතාව වර්ධනය කිරීමට, ඵලදායීතා මට්ටම් හා සේවක මණ්ඩලයේ ධෛර්ය ගොඩනැගීමට උත්සාහ දරා ඇත. සංවිධානය තුළ හා ඉන් පරිබාහිර තිරසාරත්වය උදෙසා සමාජ හා පාරිසරික ගැටළු වලට ආමන්ත්‍රණය කළ හැකි අයුරින් අපගේ සමාජ වගකීම් භූමිකාව කෙරෙහි වඩාත් අර්ථාන්විතව බලන ලදී. අපගේ දෛනික මෙහෙයුම් කටයුතු වලදී මෙන්ම විවිධ මට්ටම්වල කළමනාකරණ තීරණ ගැනීමේදී ආචාරශීලී ව්‍යාපාර පරිචයන් වෙත දැඩි අවධානයක් යොමු කිරීම හා ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

### ව්‍යාපාර පසුබිම

මූල්‍ය වර්ෂය තුළදී විශේෂයෙන් 2014 වර්ෂයේ අගභාගයේ සාමාජ දේශපාලන අභියෝග තිබියදීත් සාර්ව ආර්ථික පරිසරය මනාව කළමනාකරණය කර ගනිමින් 2013 වර්ෂයට සාපේක්ෂව ඉහළ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. මූල්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව උපකාරක ඉරියව්වෙන් පහළම වෙළෙඳපොළ පොලී අනුපාත හා තනි ඉලක්කමේ උද්ධමනයන් පවත්වා ගනිමින් ක්‍රියාත්මක විය. මෙම පොලී අනුපාත තත්වයන් පොලී අනුපාත ආන්තික බාදනයට ඉඩ සලස්වනු ලැබීය. පෞද්ගලික අංශයේ දුර්වල ණය ඉල්ලුම හේතුවෙන් මූල්‍ය වෙළෙඳපොළවල් තවමත් ඉහළ ද්‍රවශීලතාවයක පවතී. මෙම පසුබිම සමස්ත මූල්‍ය ක්ෂේත්‍රය තුළ බරපතල ලෙස විහිදී ඇත.

දේශපාලන තත්වයේ සිදු වු වෙනස තුළ සමාගමේ පාලනයේ වෙනස්කම් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිව්‍යුහගත වීම් ද සිදු විය. කෙටි කාලයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් නොසිටියද මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා අපගේ කටයුතු අති විශිෂ්ඨ ලෙස කළමණාකරණය කරමින් තීරණ ගැනීමේදි ඉතා සුපරීක්ෂාකාරී වීම තුළින් සමාගමේ කටයුතු ඉතා සාර්ථකව පවත්වා ගෙන යාමට අපට හැකි විය.

### මෙහෙයුම් ප්‍රතිඵල

අපගේ දූරදර්ශී කළමනාකරණය තුළින් ලැබූ පන්නරය මත සංකීර්ණ හා තරඟකාරී ව්‍යාපාර පරිසරය තුළ වුවද ව්‍යාපාර සැලැස්ම නිසි පරිදි අනුගමනය කිරීමෙන් විශිෂ්ඨ මෙහෙයුම් හා මූල්‍ය ප්‍රතිඵල අත්කරගත් හොඳම වර්ෂයක් ලෙස මෙම මූල්‍ය වර්ෂය නම් කිරීමට අපට හැකි විය.

පසුගිය වසරට සාපේක්ෂව අපගේ ණය මුදාහැරීම 28% කින් වර්ධනය වු අතර එය රුපියල් බිලියන 60 සීමාව ඉක්මවා ඇත. අප මෙම වසර තුළ අපගේ පොළි ආදායම පසුගිය වසරේ පොලී ආදායමට ආසන්න මට්ටමක රඳවාගැනිමට හැකි වු අතර එය රුපියල් මිලියන 19,247.62 කි. කෙසේ වෙතත් හොඳම ණය අනුපාත ඉල්ලුම කිරීමේ අප සතු හැකියාව නිසා අපගේ අරමුදල් පිරිවැය පාලනය කර ගැනීමට හැකිවීම හේතුවෙන් 20.95% වර්ධනයක් සහිතව රුපියල් මිලිනය 10,000.03 ක් ලෙස ශුද්ධ පොලී ආදායම ශක්තිමත් කිරීමට හැකිවිය. පොදුකාර්ය පිරිවැය ඉහළ මට්ටමක පැවතියද මෙහෙයුම් කටයුතු වල ප්‍රමාණාත්මකභාවය පදනම් කර ගනිමින් බදු පෙර ලාභය රුපියල් මිලිනය 5,375.11 දක්වා 22.52% ක වර්ධනයක් වාර්තා කළ අතර ශුද්ධ ලාභය රුපියල් මිලියන 3,752.96 ක් වාර්තා කරන ලදී. පෙර වර්ෂයේ 16.79%ක හිමිකම මත ප්‍රතිලාභයට සාපේක්ෂව 18.61% ක අගයක් මෙම වසරේ වාර්තා කර ගැනිමට සමත් වී ඇත.

### ණය කළඹෙහි ගුණාත්මකභාවය

මෙම වර්ෂය තුළ අපගේ මූල්‍ය විනය ස්ථිර ප්‍රවේශයක පවත්වා ගැනීමට අපට හැකිවිය. අපගේ විශේෂ අවධානය යොමු වූයේ කළඹෙහි ගුණාත්මකභාවය නඩත්තු කිරීම සඳහාය. අප ක්‍රියාත්මක වන්නාවූ අක්‍රිය ණය වර්ධනයක් සහිත අවිනිශ්චිත ව්‍යාපාර පසුබිමක් තුළ සාර්ථකව රැඳී සිටීමට නම් ව්‍යාපාරයේ කළමණාකරණය මූලිකව ම සියලුම අංශ සමඟ එකට අත්වැල් බැඳ ගැනිම තුළින් ගනුදෙනුකරුවන් සමඟ සාර්ථක සම්බන්ධතා පවත්වා ගැනිමටත්, ඵලදායි අවදානම් කලමණාකරණය කර ගැනිමත් අත්‍යවශ්‍ය කටයුතු වේ. මෙම සාමූහික ප්‍රයත්නය තුළ අපගේ අක්‍රිය ණය අනුපාතය 2.72% ක් පවතින අතරතුර 90% ට වඩා ණය එකතු කිරිමේ අනුපාතයක් පවත්වා ගැනීමට හැකිවිය. කෙසේ වෙතත් පෙර වර්ෂයට සාපේක්ෂව ආසන්න වශයෙන් 25% ක පමණ ඉහළ යාමක් පෙන්වූවද අක්‍රීය ණය අනුපාතය අවදානම් දැරීමේ ප්‍රමිත මට්ටමට හා කේෂ්ත්‍රයේ සාමාන්‍ය වන 6.9% ට වඩා ඉතා පහළ මට්ටමක පවති . (2014 වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව)

### අරමුදල් සම්පාදන හා මූල්‍ය තත්ත්වය

අපගේ ව්‍යාපාර සැලැස්ම සාක්ෂාත් කර ගනිමින් ශක්තිමත් මූල්‍ය තත්වයක් ලඟාකර ගැනීම සඳහා වෙළඳපොළ තත්වයන්ට හොඳින් ගැලපෙන ප්‍රශස්ත අරමුදල් සම්පාදන උපායමාර්යක් ව්‍යුහගත කිරිමට මෙම මූල්‍ය වර්ෂය තුළ අප බලාපොරොත්තු විය. වත්කම් හා වගකීම් වල පරිණතභාවයෙහි නොගැලපීම් මගහරවන අරමුදල් සම්පාදනයේ නිවැරදි මිශ්‍රණය ව්‍යුහගත කිරීම අපගේ ප්‍රවේශය විය.

වර්ෂය තුළ පහළම පොලී අනුපාත හා ඉහළ මට්ටමේ ද්‍රවශීලතා ලක්ෂණ වෙළෙඳපොළ තුළ දක්නට ලැබිණි. අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීම් දෙකක් විසින් ලබාදුන් අපගේ ව්‍යාපාර විචක්ෂණභාවය මත අප ණය අරමුදල් සම්පාදනයේදී වඩා හොඳම කොන්දේසි මත එකඟවීම තුළ තරගකරුවන්ට සාපේක්ෂව විශේෂ ප්‍රතිලාභ ලබා ගත හැකිවිය. දිගුකාලීන හා කෙටිකාලීන අරමුදල් අතර ගුණාත්මක මිශ්‍රණයක් තබාගැනීම අපගේ උපායමාර්ගයක් විය. අප දේශීය බැංකු සහ මූල්‍ය ආයතන වලින් ස්ථාවර අනුපාතික මූල්‍ය සම්පාදන සඳහා බොහෝ විට යොමු විය.

උපාය මාර්ගික ක්‍රියාවන් ලෙස පරිණත භාවයෙහි නොගැලපීම් අඩු කිරීමට ස්ථාවර තැන්පතු මත අපගේ අවධානය අඩු කර, බාලවයස්කාර ඉතුරුම් වැනි අඩු පිරිවැය අරමුදල් එක්රැස් කිරීම වේගවත් කිරීමත් සිදු කරන ලදී. අපගේ වෙළෙඳපොළ තත්වය තුළ පෙර වර්ෂයේදී විදේශීය අරමුදල් සම්පාදනය සඳහා කිසිදු බලගැන්වීමක් ලබාදී නැත.

2015 මාර්තු 31 දිනට අප ඉතා ශක්තිමත් මූල්‍ය තත්වයක් පවත්වා ගන්නා ලදී. එය බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රය තුළ විශාලතම වත්කම් පදනම මෙන්ම බැංකු ක්ෂේත්‍රයේ යම් ආයතන වලටද සමාන කළ හැකි රුපියල් බිලියන 100 කට වඩා වැඩි අගයකි. කොටස් හිමියන්ගේ අරමුදල් තවදුරටත් ධනාත්මක හා ශක්තිමත් කරමින් වර්ෂය අවසාන වන විට අපගේ මුළු ණය කළඹෙහි වටිනාකම රුපියල් මිලියන 98,411.20 කට ලඟාවෙන ලදී. නියාමන මාර්ගෝපදේශවල සඳහන් අවම අගයට ඉහළින් ද පෙර වර්ෂයට සමාන ද ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයක් පවත්වා ගැනීමෙන් ඉහළ ණය යෝග්‍යතාවය හා නුබුන්වත්භාවය තුළ අපගේ දිගුකාලීන ඉලක්ක වෙත යාමේ හැකියාව තහවුරු කර ඇත.

## ඒකාබද්ධ ප්‍රතිඵල

මේ වර්ෂය තුළ අපගේ ඒකාබද්ධ ප්‍රතිඵල පීපල්ස් ලීසිං සමූහයේ ශක්තිය මත නැගී සිටියේය. රුපියල් මිලියන 23,578.87 ක දළ ආදායමක් සහිතව ශක්තිමත් කාර්යසාධනයක් තුළින් ඒකාබද්ධ ආදායම් වාර්තා කර ඇත. පරිපාලිත සමාගම් වලින් ඒකාබද්ධ ආදායමට වැඩි ම කොටසක් දායක වී ඇත්තේ පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වන අතර පසුව පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවෙලොප්මන්ට් සමාගම දායක වී ඇත. බදු පසු ශුද්ධ ලාභය ඉතා ශක්තිමත්ව 19.39% ක වර්ධනයක් පෙන්වූ අතර බදු පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 5,887.42 ක පැවතිනි. සමූහයේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය 19.61% ක් වූ අතර එය පෙර වර්ෂයේදී 18.22% කි.

පීපල්ස් ලීසිං සමූහයේ ශුද්ධ වත්කම් 11.56% කින් වර්ධනය වී රුපියල් බිලියන 22.05 ක් වීම තුළ වර්ෂය අවසානයේ සමූහයේ මූල්‍ය තත්වය විදහා දක්වයි. වත්කම් මත ප්‍රතිලාභය 5% ට ලඟා විය.

## පරිපාලිත සමාගම්හි පිබිදීම

අපගේ ව්‍යාපාර උපාය මාර්ගයේ අවධානය වූයේ සාංගමික මෙහෙයුමට සහයෝගය දැක්විය හැකි හා ඉතා හොඳින් ගැලපෙන පරිපාලිත සමාගම් ගොඩනැගීමයි. අප විසින් ඔවුන්ගේ දිගුකාලීන සාර්ථකත්වය ලඟාකරවීමේ වැයමට සම්බන්ධ වී ඇති අතර ඔවුන්ට මාර්ගෝපදේශකත්වය හා දිරිය ලබාදීම නිරන්තරයෙන් සිදු කරයි. අපගේ කීර්තිය, ශක්තිමත් සන්නාමය, මූල්‍ය තීක්ෂණභාවය හා ශක්තිමත් ශාඛා ජාලය, අඛණ්ඩ ක්‍රමවේද උසස් කිරීම, නව්‍යකරණය, වෙළෙඳපොළ අවස්ථා ග්‍රහණය මනා පරිචය භාවිතය වැනි දෑ තුළින් ශක්තිමත් පසුබිමක් පරිපාලිත සමාගම් වෙත නිර්මාණය කර දීමට හැකිවිය. ඒ තුළින් තවදුරටත් ව්‍යාපාරය දියුණු කරගැනීමට, නව්‍යකරණයන් මෙහෙයුම් ක්‍රියාවලියට එකතු කරගැනීමට, අන්තර් සහයෝගතාවය ශක්තිමත් කර ගැනීමට සහ වෙළඳපල අවස්ථා ග්‍රහණය කර ගැනිමට පරිපාලිත සමාගම් වලට හැකි වූ අතර මෙම වසර විශිෂ්ඨ ප්‍රතිඵල සමඟ අවසන් කිරීමට හැකි විය.

## පෙරටුගාමී වූ රක්ෂණය

අපගේ මූලික පරිපාලිත සමාගම වන පීපල්ස් ඉන්ෂුවරනස් සමාගම වසර 03 ක් තුළ නැවතත් ජීවිත නොවන රක්ෂකයින් අතර මුල් ස්ථාන කිහිපය තුළ ස්ථාන ගතවී තරඟකාරී වූ ක්ෂේත්‍රයේ පස්වන ස්ථානය හිමිකරගෙන ඇත. වර්ෂය තුල පැවති අස්ථාවර ව්‍යාපාරික පසුබිම තුල පවා ඉතා ශක්තිමත් ස්ථාවරයක් ගොඩනගමින් කර්මාන්තයේ සාමාන්‍ය ආදායම ඉක්මවමින් හා බොහෝමයක් තරඟකරුවන් අභිබවමින් ප්‍රාරක්ෂණ ලාභය රු. මිලියන 176.70 ක් වාර්තා කර ඇත.

නීති පද්ධතියේ වෙනස්වීම් තුල ඉතා ශක්තිමත් පරිවර්තනයක් සිදුකිරීමට සමාගම සූදනම් වෙයි. 2015 වර්ෂය අගදී කොළඹ කොටස් වෙළෙඳපොලෙහි ලැයිස්තුගත කිරීමට යෝජනා කර ඇති අතර අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ආකෘතියක් ස්ථාපිත කිරීමද 2016 දී සිදු කිරීමට බලාපොරොත්තු වේ. ගතික වූ නිෂ්පාදිත, පද්ධති හා ක්‍රියාවලි තුල නිපුණතාවයන් උසස් කිරීම සඳහා මෙම පරිපාලිත සමාගමට සහයෝගය ලබාදීමට විදේශීය උපායශීලී රක්ෂණ හවුල්කරුවන් සමඟ එක්වී වර්තමානයේ සැලසුම් සකස් කරමින් සිටී.

## රථ වාහන කළමනාකරණ සේවා ශක්තිමත් කිරීම

සහක්‍රියාවන්ගේ ශක්තිය විදහාපාමින් තුල අපගේ රථ වාහන සේවා කළමණාකරණ අංශයේ වර්ධනීය තත්වයන් උත්පාදනය කිරීමට හැකියාව ලැබී ඇති අතර ඒ තුලින් විශිෂ්ඨ ඒකාබද්ධකරණයක් හා ප්‍රතිලාභ අත්කර ගත හැකි විය. ව්‍යාපාර සමූහයටම රථ වාහන කළමනාකරණ සේවා සැපයීම ශක්තිමත් කරමින් මෙම පරිපාලිත සමාගමේ තක්සේරු අංශය හරහා පීපල්ස් ලිසිං සමාගමේ සහ පිපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්හි රක්ෂණ වන්දි කළමනාකරණ ක්‍රියාවලියට විශිෂ්ඨ දායකත්වයක් සපයා ඇත. මෑත කාලයෙහි මෙහෙයුම් කටයුතු නවීකරණය කල පසු ප්‍රථම වතාවට පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් මගින් අපගේ ආයෝජනයට ලාභාංශ ලබා දී ඇත.

## අඩු ආදායම්ලාභීන් නගාසිටුවීම

ඉහල සමාජ වගකීම් දරණ ව්‍යාපාරයක් ලෙස වෙළඳපළ තුළ වූ අපගේ දැක්ම සඳහා වූ කැපවීම ඉස්මතු කරමින්, අඩු ආදායම්ලාභි ප්‍රජාව තුල වූ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සඳහා සේවා සැපයීම පෙරටු කරගනිමින් අපගේ ක්ෂුද්‍ර මූල්‍ය ඒකකයෙහි පද්ධති, ක්‍රියාවලි හා මෙහෙයුම් කටයුතු විධිමත් කරන ලදී. ඒ තුලින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වයන් උසස් කිරීමට බලාපොරොත්තු වේ. වසර 04 ක් වැනි කෙටි කාලයක් තුල පීපල්ස් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගම මගින් ඊලග පරම්පරාවට බලපෑම් කල හැකි ප්‍රධානම සාධකය හා ගෘහය තුල සකසුරුවම හා වගකීම දරන කාන්තාවන්ද ඇතුළුව සැලකිය යුතු පාරිභෝගික පදනමක් නිර්මාණය කිරීමට සමත් වී ඇත. මෙම වර්ෂය තුලදී අපගේ ක්ෂුද්‍ර මූල්‍ය ණය කලඹ රු. බිලියන 01 ක් පසු කර ඇත.

## දේපළ සංවර්ධනය

පීපල්ස් ලීසිං සමූහයට ක්‍රමාණුකූලව හැඩගැසෙමින් හා ස්ථාවර වෙමින් මෙම වර්ෂය තුල අපගේ ප්‍රොපර්ටි ඩිවලෝප්මන්ට් ආයතනය ඉදිරියට ගොස් ඇත. මෙම ආයතනය මඟින් පීපල්ස් ලීසිං වවුනියා ශාඛා දෙවන අදියර අවසන් කර අපගේ මව් සමාගමට භාර දී ඇති

අතර තවත් ව්‍යාපෘති 06 ක කටයුතු සිදු කරමින් සිටී. එසේම ඉතා ශක්තිමත් ප්‍රතිඵල ලඟාකරගනිමින් රු. මිලියන 11 ක ලාභාංශයක් ද බෙදාහරින ලදී.

ප්‍රොපර්ට් ඩිවලෝප්මන්ට් ආයතනය ආයෝජන මණ්ඩල අනුමැතිය ලත් අපගේ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ට් මගින් කොළඹ 05 යෝජිත කාර්යාල සංකීර්ණයේ ඉදිකිරීම් සමග ස්ථාවර ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. යාබද පර්චස් 72.25 ක් වූ ඉඩම මිලදී ගැනීමත් සමග යෝජිත ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමට හැව්ලොක් ප්‍රොපර්ට් ඩිවලෝප්මන්ට් ලිමිටඩ් පියවර ගන්නා ලදී. ඒ තුල ඇස්තමේන්තු ගත පිරිවැය 29.53% කින් ඉහල යන අතර 2016 මැයි මස දී ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

පසුගිය වර්ෂයේ වාර්තා කල ආකාරයට යාපනය ප්‍රදේශයේ කාමර 30 ක නිවාඩු නිකේතනයක් නාගරික සංවර්ධන අධිකාරිය සමග ඉදිකිරීමට සැලසුම් කලද එය අපේක්ෂා කල අයුරින් ඉෂ්ඨ නොවිය. ආරම්භය කාලෝචිත නොවූ එම ව්‍යාපෘතිය අපගේ මධ්‍ය කාලීන හා දිගුකාලීන සැලසුම් තුළ නැවත සලකා බැලීමට බලාපොරොත්තුවේ.

## අති විශාල ශාඛා ජාලය හා නිෂ්පාදිත පෙළ

සමාජ හා ආර්ථික වශයෙන් අවම පහසුකම් ඇති ප්‍රදේශ පවා ආවරණය වන පරිදි දිවයින පුරා පුළුල් පාරිභෝගික ජාලයකට සේවා සැපයීමට, පුළුල් බෙදාහැරීම් ක්‍රමෝපායන් මගින් අප සමත් වී ඇත. වර්ෂය අවසන් වන විට උපායශීලී ප්‍රදේශ 04 ක ස්ථාපිත කල නව ශාඛා 04 සමග මෙහෙයුම් කවුළු 109ක් හා ශාඛා 89 ක් වූ බෙදා හැරීම් ජාලයක් අප සතුය.

ණය, ඉස්ලාමීය මූල්‍ය සහ තැන්පතු ඇතුලත් කල්බදු හා මූල්‍ය වන අපගේ මූලික විශේෂඥ ව්‍යාපාර කටයුතු ද සමග පරිපාලිත සමාගම්වල සේවා වන රක්ෂණය, රථවාහන සේවා කළමනාකරණය, රථ වාහන තක්සේරුකරණය හා ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු වල උපකාරයෙන් විවිධාකාරී පාරිභෝගිකයන්ගේ සියලුම අවශ්‍යතා සපුරාලීමට හැකියාව ලැබී ඇත. වටිනාකම් එකතු කිරීම සහ නව්‍යකරණය ඇති කිරීම, නිෂ්පාදිත කලඹගත කිරීම හා හරස් විකුණුම් වැනි දෑ තනි තනි ගණුදෙනු කරුවන්ට ගැලපෙන පරිදි ඉතා නුවණැතිව ක්‍රියාවට නැංවිය. ආන්තික ගණුදෙනු වැනි නව නිෂ්පාදිත ශක්තිමත් කිරීමට අප විශේෂ අවධානයක් යොමුකර ඇත.

## පාරිභෝගික නැඹුරුව

අපගේ තත්ත්වය තව දුරටත් වර්ධනය කරමින් අවම ඉලක්ක පරාසය 10% සිට 15% ලෙස රඳවා ගනිමින් වෘත්තීයභාවය හා වගකීම මත පදනම් අපගේ පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශයේ ශක්තිමත්භාවය ඉහළ නැංවීමට මෙම වසරේ බලාපොරොත්තු විය. ශාඛා මට්ටමින් ඉසව් සංවිධානය කරමින්, පක්ෂපාතීත්වය ඇගයීමට ලක් කරමින්, සේවක පුහුණුව සමග සේවා සැපයීමේ ගුණාත්මකභාවය උසස් කිරීම තුළින් හා පද්ධති හා ක්‍රියාවලි තුළ යෝග්‍ය ආයෝජන තුලින් ප්‍රතිචාර දැක්වීම ඉහල නැංවීමටත්, කාර්යක්ෂමතාවයන් වැඩිකිරීමටත් හා ක්ෂණික පරිවර්තනයක් සිදු කිරීමටත් අප ශක්තිමත්ව අත්වැල් බැද ගන්නා ලදී.

මෙම දැරූ ප්‍රයත්නයන් තුල අපගේ වෙළෙඳපොල කොටස 19.78 % කින් වර්ධනය කර ගැනීමටත් පාරිභෝගික පදනම 260,054 දක්වා වර්ධනය කර ගැන්වීමටත්, අඛණ්ඩව 13 වන වර්ෂයටත් කල්බදු ක්ෂේත්‍රය තුල ප්‍රමුඛයා වීමටත් බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රය තුල ආධිපත්‍ය තබා ගැනීමටත් හැකියාව ලැබී ඇත.

## සේවක බැඳීම හා බල ගැන්වීම

අපගේ සාංගමික උපායමාර්ගය තුල හදවත ලෙස අප සලකන්නේ සේවක බැඳීමය. විවිධ දක්ෂතා වලින් සපිරි අභිප්‍රේරණය හා ආචාරධර්ම වටිනාකම් වලින් යුත් සේවකයින් මත කටයුතු කිරීම අපගේ විශේෂත්වයේ හරය හා සමූහයේ ඉදිරි ගමනෙහි ප්‍රධාන මූලය ලෙස සලකනු ලැබේ. ඔවුන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම, හැකියාවන් ගොඩනැගීම, වෘත්තීය සංවර්ධනයට උපකාරී වීම හා ඔවුන්ගේ යහ පැවැත්ම සහතික වීම තුලින් ඔවුන් සමග බැඳීම තවදුරටත් තහවුරු කර ඇත.

ප්‍රධාන කාර්යාලයේ සිට ශාඛා තෙක්ම මුළු සංවිධානය පුරා ඇති මානව සම්පත පුහුණු කිරීම් සඳහා රු. මිලියන 26.76ක් ආයෝජනය කරන ලද අතර අපගේ සාංගමික අරමුණු සඳහා අවශ්‍ය දැනුමට ආමන්ත්‍රණය කිරීම සඳහාම විශේෂ වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. දේශීය හා අන්තර් ජාතික වශයෙන් වෘත්තීය අධ්‍යාපනය ඉහල නංවා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යයන කටයුතු කිරීම සඳහා දිරිගැන්වීමට අනුග්‍රහයන්ද පිරිනමන ලදී.

කාර්යසාධන මත පදනම් වූ වැඩ පරිසරය පිලිබඳ අචල විශ්වාසය රඳවා ගැනීමටද අප හට වර්ෂය තුල හැකිවිය. සමානාත්මතාවය යන අපගේ සාංගමික වටිනාකම ඉහළට ඔසවා තබමින් වඩා ක්‍රමවත් හා විනිවිදභාවයෙන් යුතු ඇගයීම් ක්‍රමයක් තුල සේවකයින්ගේ ඉලක්ක කාර්යසාධනයන් වෙත ලඟා කරවීමට බලාපොරොත්තු විය. අපගේ වාර්ෂික ශාඛා තරඟය තුල හොදම ශාඛා හා හොදම කාර්යසාධන පෙන්වන්නන් හඳුනා ගන්නා ලදී. මෙම වර්ෂය තුලද සංවිධානය පුරා සේවකයින් 50 කට වැඩි පිරිසක් ඇගයීමට ලක් විය.

## සමාජ වගකීම

මෙම වර්ෂය තුලදී සමාජ වගකීම් ක්‍රියාමාර්ග හා ව්‍යාපෘති පවත්වා ගෙනයාමට නිසි සැලසුම් අනුගමනය කිරීමට බැඳී සිටින ලදී. හරිත පරිසරයක් නිර්මාණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා අප ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයේ ප්‍රජාවන් සමග සම්බන්ධ වීම සඳහා අප කොතරම් හොඳින් ක්‍රියා කර ඇත්ද යන්න සොයා බලා ඇත.

පාරිසරික ආරක්ෂණය, ව්‍යවසායකත්වය ගොඩනැගීම, මූල්‍ය සාක්ෂරතාවය ඉහල දැමීම, අධ්‍යාපන මට්ටම උසස් කිරීම, මාර්ග විනය වෙනුවෙන් හඬ නැගීම හා අනෙකුත් ප්‍රජා ප්‍රමුඛතාවයන්ට උදව් දීම යන ක්ෂේත්‍ර පහ ආවරණය වන පරිදි "අපගේ සැලකිල්ල" යන තේමාව තුල ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා නියෝජනය කරන ස්වේච්ඡාවෙන් සම්බන්ධ වූ අපගේ සේවක කණ්ඩායම විධිමත්ව සැලසුම් කර ක්‍රියාත්මක වන ලදී. මෙම ව්‍යාපාරය තුල රු. මිලියන 70 ක ආයෝජනයෙන් ව්‍යාපෘති 132 ක් සිදු කල අතර ඒ සඳහා ස්වේච්ඡා පැය 10,546 ක් වැය කරන ලදී.

## විශිෂ්ඨත්වය ඇගයීම

අවුරුදු 18 ක කාල සීමාව තුල අප ආදර්ශවත් ව්‍යාපාරයක් ලෙස නැගී සිටිය අතර උපායමාර්ග සැලසුම් කිරිමේදි සමාජ දැනුම හා වගකිම සංයුක්ත කරන ලදී. සැබවින්ම පසුගිය වර්ෂ ගණනාව පුරා අප බොහෝ සම්මාන ලද අතර ක්ෂේත්‍රය තුල පෙන්වූ ව්‍යාපාර නිපුණතාවය, ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග හා මනා පරිචයන් හේතුවෙන් දේශීය හා අන්තර්ජාතික ඇගයීමට පාත්‍ර විය.

ෆිච් රේටින් ඉන්ටැර්නැෂනල් වෙතින් **B+** හා ස්ටෑන්ඩර්ඩ් සහ පූවර්ස් වෙතින් **B+/B** වශයෙන් අන්තර්ජාතික ණෛරීත්ව ශ්‍රේණියක් ලබාගත් ලංකාවේ එකම බැංකු නොවන මූල්‍ය ආයතනය වීම අපගේ විශිෂ්ඨත්වයයි. ෆිච් රේටින් ලංකා ආයතනය අප සමාගම සඳහා **AA-** ශ්‍රේණිය ලබාදීම තුල ක්ෂේත්‍රයේ ඉහලම ශ්‍රේණිය අප සතු වේ. කොලඹ කොටස් වෙළෙඳපොළෙහි එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මිල දර්ශකයට ඇතුලත් වීම තුල ශ්‍රී ලංකාවේ හොඳම ලැයිස්තුගත සමාගම් 20 ට ඇතුලත් වීමේ භාග්‍යයද අප සමාගම සතු විය. 2015 ස්ලිම් නීල්සන් පීපල්ස් සම්මාන උළෙලේ දී **"Financial Service Provider of the year"** සම්මානය නොකඩවා තුන්වන වරටත් අප සමාගමට පිරිනැමීය.

අපගේ මෙහෙයුම් කටයුතු තුල අප ගත් තිරසාර ක්‍රියාමාර්ග ඇගයීමෙන් ලංකා වාණිජ මණ්ඩලය "හොඳම සාංගමික පුරවැසියන් දස දෙනා" අතර අප සමාගමද හදුනාග ත්නා ලදී. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය මගින් සංවිධානය කල **"CNCI Achiever of Industrial Awards – 2014"** හිදී රන් සම්මාන දෙකක් හා ලංකා ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කල **"National Business Excellence Awards 2014"** උළෙලේදී රිදී සම්මානයද දිනා ගන්නා ලදී. අපගේ සේවක සංවර්ධන ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනය සංවිධානය කල **"People's Development Awards 2014"** හිදි රිදී සම්මානයක්ද දිනා ගත්හ. ශරියා මාර්ගෝපදේශ වලට අනුකූලව අපගේ ඉස්ලාමීය මූල්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක වීම ඇගයීම ද **Sri Lanka Islamic banking & financial industry Awards** වලදී සිදු විය.

## වාර්තාකරණයේ විශිෂ්ඨත්වය

අපගේ වාර්තාකරණ ක්‍රියාමාර්ගයේ ගුණාත්මකභාවය හා ප්‍රමිත මෙම වසර තුලද තවදුරටත් ඉහල දැමීමට පියවර ගන්නා ලදී. අපගේ සංකලිත වාර්තාකරණ ක්‍රියාවලියේ ශක්තිමත්භාවය තවදුරටත් වර්ධනය කිරිම සඳහා ගෝලීය වාර්තාකරණ ක්‍රියාවලියේ නවතම පියවරයන් සමඟ අපගේ ව්‍යාපාර ප්‍රවේශයන්, කාර්යසාධනයන් කෙටිකාලීන නොවන හා තිරසාර මුහුණුවරක් ගත් අනාගත සැලසුම් මුසු කරන ලදි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය ආයතනය සංවිධානය කල 50 වෙනි වාර්ෂික වාර්තා සම්මාන උළල - 2014 හිදී **"Choice of the People"** යන තේමාව යටතේ වූ 2013/2014 දී විශිෂ්ඨ සම්මාන 03 ක් හිමිවිය. **"Overall Excellence in Annual Financial Reporting"** සදහා රිදී සම්මානය අප සමාගමට ලැබීමත් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතනයක් ප්‍රථම වතාවට එම සම්මානයෙන් පිදුම් ලැබූ අවස්ථාව ලෙස ඉතිහාසයට එක් විය. එසේම සාංගමික සමාජ වගකීම් වාර්තාකරණය සදහා රන් සම්මානයද, 07 වන වරටත් මූල්‍ය ක්ෂේත්‍රයේ හොඳම වාර්ෂික වාර්තාව සදහා රන් සම්මානයද, ඇමරිකානු සන්නිවේදන වෘත්තිකයින් එක්සත් මණ්ඩලය විසින් සංවිධානය කළ 2013/2014 වාර්ෂික වාර්තාව සඳහා සම්මාන 02 ක් ද ලබා දී ඇත. පසුගිය වර්ෂයේදි හොඳම වාර්ෂික වාර්තා තුල 26 වන ස්ථානයට පත්වී ඇත. එය පෙර වසරේ ලැබූ 36 වන ස්ථනය සමඟ සැසඳීමේදි ඉහළ වර්ධනයකි. දකුණු ආසියානු ගණකාධිකාරීන්ගේ සම්මේලනය සංවිධානය කල 2014 වාර්ෂික වාර්තා හොදම ඉදිරිපත් කිරීම් සම්මාන වලදීද අප ඇගයීමට ලක්විය.

## අපේක්ෂාවන් සහ සැලසුම්

තවමත් සාර්ව සුභවාදී අවස්ථාවලින් හා අභියෝග වලින් පිරුණු සංකිර්ණ ව්‍යාපාර පරිසරයක් තුල අප මෙහෙයුම් කටයුතු සිදු කරයි. අපගේ සංවිධානය අවස්ථා මත හැසිරවීමට හා අභියෝග හමුවේ නැගී සිටීමට අවශ්‍ය විශේෂඥතාවය හා නිපුණතාවයන් අප සතු වේ.

ඉදිරි වර්ෂ 03 සඳහා වු අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවයන් පැහැදිලිව අඩංගු කරමින් සංකලිත ව්‍යාපාර ප්‍රවේශයක් මත අපගේ සාංගමික සැලැස්ම සකස් කර ඇත. ඒකාබද්ධ පදනම තුල 20% සහ 25% ක ඉහල මට්ටමේ ඉලක්ක ගත වර්ධනයක් සමඟ අප බලාපොරොත්තු වන්නේ අපගේ වෙළෙදපොළ කොටස වර්ධනය කිරීමටත්, බෙදාහැරීමේ මාර්ග තවදුරටත් ඒකාබද්ධකරණය කිරීමටත්ය. ඉදිරි වර්ෂ තුන තුල නව ශාඛා කිහිපයක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති අතර අපගේ පිරිවැය ඵලදායී මෙහෙයුම් කවුළු තව දුරටත් විශිෂ්ඨ ලෙස ශක්තිමත් කිරීමට බලපොරොත්තු වේ. අප වැනි සීග්‍රයෙන් වර්ධනය වන සංවිධාන වලට අවශ්‍ය ඵලදායී උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට හා පිරිවැය තාර්කීකරණයට හැකියාව ලැබෙන පරිදි කලාප හතරක ප්‍රධාන කාර්යාල හතරක් යටතේ පොකුරු ක්‍රමයට ශාඛා කළමනාකරණය කිරීම සදහා පරිපාලනය විමධ්‍යගත කිරීමට අප සැලසුම් කර ඇත. නව නිෂ්පාදිත ලෙස ආන්තික ණය සැපයුම්කරණය හා ණය සාධ්‍යකරණය වෙත වැඩි අවධානයක් යොමු කරමින් අපගේ විවිධාංගීකරණ ක්‍රියා මාර්ග වේගවත්ව ක්‍රියාවට නැංවීමට තීරණය කර ඇත. එසේම දේශීය හා අන්තර්ජාතික වශයෙන් පාරිභෝගිකයින් මෙන්ම ආයෝජකයින්ගේ ආකර්ශනය ඉහල නැංවීමට, ව්‍යාපාර සංවර්ධන ක්‍රියා මාර්ග සිදු කිරීමට සහ වෙළෙද සන්නාම වටිනාකම් ඉහල නැංවීමට විශේෂ සැලසුම් සකස් කර ඇත. එසේම අපගේ සාමූහික අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙහෙයුම් කටයුතු වඩාත් ඵලදායීව කිරීම සදහා පරිපාලිත සමාගම් සදහා උපරිම සහයෝගය ලබා දීම ට බලාපොරොත්තු වේ.


ඉහල මට්ටමේ ක්‍රියාමාර්ග වලට අමතරව අපගේ ණය කලඹෙහි ගුණාත්මකභාවය කළමනාකරණය කිරීමටද අප විචක්ෂණශීලී වන්නෙමු. අපගේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම හා තහවුරු කිරීම සඳහා ඵලදායී මූල්‍ය සම්පාදන උපායමාර්ග යොදා ගැනීමටද වෙළඳපල වෙනස් වීම් වලට ඉහල ප්‍රතිචාර දැක්වීම සඳහාද අප අවධානය යොමු කරනු ඇත. අවදානම්

හා අනුකූලතා කළමනාකරණය ඉදිරි වර්ෂ තුල තීරණාත්මක භූමිකාවක් හොබවනු ඇත. අපගේ පාරිභෝගිකයා පිලිබඳ දැන ගැනීම, මුදල් විශුද්ධිකරණයට එරෙහි වීම හා අහිතකර තරඟකාරිත්ව හැසිරීම් වලට එරෙහිවීම ඇතුළුව අපගේ ආචාරශීලී ව්‍යාපාර පරිචයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහාද ඉදිරි වසරේ දි අවධානය යොමු කරනු ඇත. පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි උපායමාර්ගික ක්‍රියාමාර්ග සඳහා විශිෂ්ඨ අවධානයක් යොමු කිරීමත් සමග අපගේ සමාජ වගකීම් ව්‍යාපෘතිය වන "අපගේ සැලකිල්ල" මීලඟ අදියර වෙත උසස් කිරීමට බලාපොරොත්තු වේ. මධ්‍ය හා දිගුකාලීනව අප අපගේ දේශ සීමාවෙන් ඔබ්බට ගොස් එනම් දකුණු ආසියානු කලාපය තුළ අපගේ මෙහෙයුම් කටයුතු දියත් කිරීමට සැලසුම් කරමින් සිටී.

### ස්තුතිය

අපගේ ව්‍යාපාර පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා සෑම පාර්ශවකරුවකුගේම භූමිකාව පිලිබඳ මා තුල ඉහල දැනුවත් භාවයක් ඇත. මෙම අසීරු කාල සීමාව තුල අපගේ අරමුණු ඉටුකර ගැනීමෙහි ලා අප කෙරෙහි තැබූ විශ්වාසය හා ලබා දුන් සහයෝගය වෙනුවෙන් මාගේ ප්‍රණාමය පුද කරමි.

අභිනව සභාපතිතුමන් හා අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා ගෞරවයෙන් පිළිගන්නා අතර ඔවුන්ගේ දූරදක්නා සිතුවිලි හා නායකත්වය බලාපොරොත්තු වෙමි. එසේම ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් අපගේ හා මහජන බැංකුවේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ගෞරවනීය ස්තුතිය පුදකරමි. අපගේ සහ අපගේ පරිපාලිත සමාගම් වල සමස්ත සේවක මණ්ඩලය අගය කිරීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් ලෙස සලකමි. එසේම පීපල්ස් ලිසිං සමූහයේ ඉහල අරමුණු සඳහා උපායමාර්ගික ඉලක්ක වෙතට දැඩි උනන්දුවකින්, කණ්ඩායම් හැඟීමෙන් හා උද්‍යෝගයෙන් කටයුතු කල ආකාරය පිලිබඳව මා විශ්මයට පත්විය. එසේම ක්ෂේත්‍රයේ විවිධභාවය, සාධාරණත්වය හා තිරසාරභාවය උදෙසා ප්‍රතිපත්තිමය ව්‍යුහය සකසන ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් වෙළෙඳපොල යන නියාමන ආයතන වෙත මාගේ ස්තුතිය පුද කර සිටිමි. එසේම මෙතෙක් කාලයක් අප සමග රැඳී සිටි පාරිභෝගිකයින්, ආයෝජකයින්, සැපයුම්කරුවන්, උපායමාර්ගික හවුල්කරුවන් හා අනෙකුත් සියළුම පාර්ශවකරුවන්ට මාගේ කෘතඥතාව පුද කරමි. මෙවන් අභියෝගාත්මක කාලක් තුල තිරසාර ප්‍රගතියක් වෙත පීපල්ස් ලීසිං සමූහයේ ගමන් මග තවදුරටත් රැගෙන යාමට ඉහල මට්ටමේ සහයෝගයක් ඔබ සැමගෙන් බලාපොරොත්තු වෙමි.



**ඩී. පී . කුමාරගේ**
*ප්‍රධාන විධායක නිලධාරී*
**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී**

2015 අප්‍රේල් 29 දින
කොළඹදී.

# ස්වාධීන විගණක වරුන්ගේ වාර්තාවේ පරිවර්තනය

**පහත දැක්වෙන ස්වාධීන විගණන වාර්තාව පරිවර්ථනය කරන ලද්දේ අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීවරුන් විසින් විගණනය කර 2015 අප්‍රේල් 29 වන දින අත්සන් කරන ලද පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී සමාගමේ වාර්ෂික වාර්තාවෙහි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළකරන ලද ස්වාධීන විගණන වාර්තාව අනුසාරයෙනි.**

**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී කොටස් හිමියන් වෙත,**

### මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව

2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහ පිටු අංක 335 සිට 443 දක්වා ඇති අනෙකුත් පැහැදිලි කිරීම් තොරතුරු වලින් සමන්විත පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ පරිපාලිත සමාගම් ("සමූහය") වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

### මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ ස්වරූපයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය වගකීම දැරීම සහ වැරදි හා වංචා හේතුවෙන් සිදුවිය හැකි ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ වලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණය කිරීම අවශ්‍ය වේ.

### විගණකවරුන්ගේ වගකීම

අපගේ වගකීම වනුයේ අප සිදුකරන විගණනය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමය. අප විසින් විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුව සිදු කරයි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ වලින් තොර බවට සැලකිය යුතු සහතික වීමත් ලබාදීමට විගණනය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් ආචාරධර්ම අවශ්‍යතාවට අනුකූල වීමත් එම ප්‍රමිත තුලින් අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක සාක්ෂි සහ අනාවරණයන් ලබාගැනීමට ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට අදාල වේ. එම ක්‍රියාපටිපාටි තෝරා ගැනීම රඳා පවතින්නේ වැරදි හා වංචා හේතුකොට ගෙන සිදුවිය හැකි මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශ සිදුවීමේ අවදානම තක්සේරු කිරීමත් ඇතුලුව විගණකවරුන්ගේ විනිශ්චය මතය. එම අවදානම තක්සේරු කිරීමේදී අදාල තත්වය මත නිර්මාණය කල විගණන ක්‍රියාපටිපාටි වලට අනුව සමාගම සත්‍ය හා සාධාරණ ස්වරූපයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් විගණකවරු සැලකිල්ලට ගනු ලබන අතර නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයන්ගේ කාර්යක්‍ෂමතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම එහි අරමුණ නොවේ. එසේම අධ්‍යක්‍ෂ මණ්ඩලය සිදුකල ගිණුම්කරණ ප්‍රතිපත්ති වල අදාල බව සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණ බව ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයට ඇතුලත් වේ.අපගේ විගණන මතය ප්‍රකාශ කිරීමට පදනම් වූ විගණන සාක්ෂි ප්‍රමාණවත් හා අදාල වන බව අප විශ්වාසයෙන් ප්‍රකාශ කර සිටිනවා.

### විගණන මතය

අපගේ විගණන මතය වන්නේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල 2015 මාර්තු 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ බවත් එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල බවත්ය.

### අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා මත වාර්තාව

2007 අංක 07 දරණ සමාගම් පනතේ වගන්ති 163 (2) අවශ්‍යතාවය අනුව අප පහත ප්‍රකාශ සිදුකරයි.

අ) විගණනයේ පදනම සහ විගණනයේ විෂය පථය හා සීමාවන් ඉහතින් ප්‍රකාශ කර ඇත.

ආ) අපගේ විගණන මතය තුල;

- විගණනයට අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප ලබා ගෙන ඇති අතර සහ අපගේ විභාගයන්ට අනුව සමාගම විසින් යෝග්‍ය ගිණුම්කරණ වාර්තා තබාගෙන ඇත.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුල 2015 මාර්තු 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ බවත් එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල බවත්ය.
- 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 හා 153 වගන්ති වල අවශ්‍යතාවයන්ට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන අනුකූල වේ.

වරලත් ගණකාධිකාරීවරු
2015 අප්‍රේල් 29 දින
කොළඹදී

# ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමාගම 2015 රු.'000 | සමාගම 2014 රු.'000 | සමූහය 2015 රු.'000 | සමූහය 2014 රු.'000 |
|---|---|---|---|---|
| **ආදායම** | **20,541,628** | 20,627,792 | **23,578,871** | 24,177,225 |
| පොළී ආදායම | **19,247,619** | 19,533,602 | **19,595,091** | 20,053,448 |
| අඩුකළා: පොළී වියදම් | **9,247,594** | 11,265,957 | **9,350,272** | 11,395,898 |
| **ශුද්ධ පොළී ආදායම** | **10,000,025** | 8,267,645 | **10,244,819** | 8,657,550 |
| | | | | |
| ශුද්ධ රක්‍ෂණ වාරික ඉපැයුම් | **-** | - | **2,949,902** | 3,464,453 |
| ගාස්තු සහ කොමිස් ආදායම් | **874,034** | 853,614 | **576,592** | 393,017 |
| ශුද්ධ වෙළෙඳ ආදායම් | **57,985** | 7,628 | **120,741** | 29,838 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **361,990** | 232,948 | **336,545** | 236,469 |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **11,294,034** | 9,361,835 | **14,228,599** | 12,781,327 |
| අඩුකළා: ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණය | **1,644,876** | 1,217,746 | **1,670,681** | 1,229,856 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම්** | **9,649,158** | 8,144,089 | **12,557,918** | 11,551,471 |
| | | | | |
| **අඩුකළා:** | | | | |
| පුද්ගල වියදම් | **1,565,226** | 1,338,049 | **1,802,013** | 1,521,900 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | **201,261** | 181,950 | **280,116** | 260,413 |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | **15,807** | 14,860 | **18,804** | 19,864 |
| ප්‍රතිලාභ, හිමිකම්පෑම් හා ප්‍රතිරක්‍ෂණ වියදම් | **-** | - | **2,120,331** | 2,596,617 |
| වෙනත් මෙහෙයුම් වියදම් | **2,129,180** | 1,930,255 | **2,077,112** | 1,919,244 |
| මුළු මෙහෙයුම් වියදම් | **3,911,474** | 3,465,114 | **6,298,376** | 6,318,038 |
| | | | | |
| **එකතු කළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභය** | **5,737,684** | 4,678,975 | **6,259,542** | 5,233,433 |
| අඩුකළා: මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බදු | **362,571** | 292,011 | **372,121** | 302,374 |
| බදු පෙර මෙහෙයුම් ලාභය | **5,375,113** | 4,386,964 | **5,887,421** | 4,931,059 |
| අඩුකළා: ආදායම් බදු වියදම් | **1,622,153** | 1,263,218 | **1,785,879** | 1,467,844 |
| **වර්ෂය සඳහා ලාභය** | **3,752,960** | 3,123,746 | **4,101,542** | 3,463,215 |
| | | | | |
| **ලාභය මත කොටසක ඉපයුම** | | | | |
| සාමාන්‍ය කොටසකට මූලික ඉපයුම (රු.) | | | **2.60** | 2.19 |
| සාමාන්‍ය කොටසකට ලාභාංශය (රු.) | **1.25** | 1.25 | | |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමාගම 2015 රු.'000 | සමාගම 2014 රු.'000 | සමූහය 2015 රු.'000 | සමූහය 2014 රු.'000 |
|---|---|---|---|---|
| **වර්ෂයට අදාල ලාභය** | **3,752,960** | 3,123,746 | **4,101,542** | 3,463,215 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)** | | | | |
| **ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභ වලට නැවත වර්ගීකරණය කළ හැකි වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ)** | | | | |
| මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය ආයෝජන මත ලාභ /(අලාභ) | **6,318** | 653 | **6,318** | 653 |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් | | | | |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් නැවත ගණනය කළ ලාභ/(අලාභ) | **155,131** | 39,888 | **154,040** | 42,189 |
| හානිකරණය වෙනුවෙන් ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනයට ප්‍රතිවර්ගීකරණය | **-** | 25,000 | **-** | 25,000 |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභ වලට නැවත වර්ගීකරණය කළ හැකි ශුද්ධ වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ) | **161,449** | 65,541 | **160,358** | 67,842 |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභ වලට නැවත වර්ගීකරණය කළ නොහැකි වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ) | | | | |
| නිශ්චිත ලාභ ක්‍රමයක් මගින් ලද ආයුගණක ලාභ හා අලාභ | **375** | (57,236) | **(23)** | (57,574) |
| විලම්භිත බදු බලපෑම | **(105)** | 16,026 | **69** | 16,778 |
| ඉදිරි කාලච්ඡේදවල ලාභ හෝ අලාභ වලට නැවත වර්ගීකරණය කළ නොහැකි ශුද්ධ වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ) | **270** | (41,210) | **46** | (40,796) |
| **වර්ෂයට අදල අනෙකුත් විස්තීර්ණ ආදායම (ශුද්ධ)** | **161,719** | 24,331 | **160,404** | 27,046 |
| **වර්ෂයට අදල මුළු විස්තීර්ණ ආදායම** | **3,914,679** | 3,148,077 | **4,261,946** | 3,490,261 |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **වත්කම්** | | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 3,139,139 | 11,452,997 | 3,413,951 | 11,695,561 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ඇති ශේෂයන් | 326,321 | 3,329,562 | 1,830,668 | 4,725,904 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 245 | - | 245 |
| මූල්‍ය ආයෝජන - ගණුදෙනු කිරීම සඳහා ඇති | 196,193 | 184,243 | 503,268 | 378,312 |
| ණය සහ ලැබිය යුතු දෑ | 98,411,195 | 90,218,355 | 97,996,856 | 90,341,901 |
| රක්‍ෂණ හා ප්‍රතිරක්‍ෂණ ලැබියයුතු | - | - | 187,300 | 137,576 |
| මූල්‍ය ආයෝජන- විකිණීම සඳහා පවතින | 939,199 | 224,068 | 2,043,342 | 1,316,819 |
| මූල්‍ය ආයෝජන- පරිණත වීම තෙක් රඳවා ගෙන ඇති | 5,266,407 | 4,746,558 | 5,266,407 | 4,746,558 |
| පරිපාලිත සමාගම් වල ආයෝජන | 1,875,000 | 1,475,000 | - | - |
| ආශ්‍රිත සමාගම් වල ආයෝජන | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ | 1,108,681 | 801,135 | 3,804,706 | 3,052,089 |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 337,647 | 347,927 | 345,641 | 355,732 |
| දේපළ ආයෝජන | - | 55,000 | - | - |
| වෙනත් වත්කම් | 723,197 | 941,346 | 1,768,840 | 1,666,080 |
| **මුළු වත්කම්** | 112,322,979 | 113,776,436 | 117,160,979 | 118,416,777 |
| **වගකීම්** | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | 21,228,600 | 14,131,807 | 22,391,144 | 15,776,883 |
| ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 34,022,572 | 40,921,485 | 33,930,221 | 40,839,278 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 28,690,194 | 34,473,380 | 28,586,186 | 34,369,214 |
| වෙනත් මූල්‍ය වගකීම් | 3,234,445 | 1,857,324 | 3,165,912 | 1,728,158 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 92,193 | - | 92,193 | - |
| ගෙවිය යුතු රක්‍ෂණ හා ප්‍රතිරක්‍ෂණ වගකීම් | - | - | 2,894,358 | 2,570,540 |
| ප්‍රවර්තන බදු වගකීම් | 550,042 | 446,832 | 618,198 | 540,841 |
| විලම්භිත බදු වගකීම් | 1,949,490 | 1,573,461 | 1,976,418 | 1,598,573 |
| වෙනත් වගකීම් | 1,419,655 | 1,176,211 | 1,453,490 | 1,225,480 |
| **මුළු වගකීම්** | 91,187,191 | 94,580,500 | 95,108,120 | 98,648,967 |
| **හිමිකම** | | | | |
| ප්‍රාග්ධනය | 12,936,073 | 12,736,073 | 12,936,073 | 12,736,073 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 1,204,116 | 1,016,467 | 1,204,116 | 1,016,467 |
| රඳවාගත් ඉපයුම් | 6,489,599 | 4,001,931 | 7,403,781 | 4,569,825 |
| වෙනත් සංචිත | 506,000 | 1,441,465 | 508,889 | 1,445,445 |
| **මුළු හිමිකම** | 21,135,788 | 19,195,936 | 22,052,859 | 19,767,810 |
| **මුළු වගකීම් හා හිමිකම** | 112,322,979 | 113,776,436 | 117,160,979 | 118,416,777 |
| **අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්** | 4,400,063 | 2,379,252 | 5,308,209 | 3,007,091 |
| **සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් (රු.)** | 13.38 | 12.15 | 13.96 | 12.51 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතා වලට අනුකූලව පිළියෙල කර ඇති බවට අප සහතික කරන්නෙමු.

**සංජීව බණ්ඩාරනායක**
*ප්‍රධාන මූල්‍ය නිලධාරී*

**ඩී. පී කුමාරගේ**
*ප්‍රධාන විධායක නිලධාරී*

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ;

**හේමසිරි ප්‍රනාන්දු**
*සභාපති*

**එම්.පී අමිර්තනායගම්**
*උප සභාපති*

2015 අප්‍රේල් මස 29 දින
කොළඹදී

PLC